

# දිවයිනේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනය සමග එක්වීමට ඔබටත් අවස්ථාවක්

# ශ්‍රී ලංකා මහ බැංකුව

1949 අංක 58 දරන මුදල් නීති පනතින් සංස්ථාපනය කර ඇති අපගේ ආයතනය දිවයිනේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයයි. දැනට පශ්චාත් උපාධිධාරීන් (PhD/Masters) 165 ක්, උපාධිධාරීන් 333 ක්, නීතිවේදීන් 26 ක් සහ ගණකාධිකාරිවරුන් 53 ක් මෙම ආයතනයේ සේවය කරනු ලැබේ. බැංකුවේ කටයුතු මුළුමනින්ම පාහේ පරිගණකගත කර ඇති අතර, සියළුම නිලධාරීන් නවීන පරිගණක ජාලයන් මගින් සම්බන්ධ කර ඇත.

උපාය මාර්ගික සැලැස්මෙහි දැක්වෙන පරිදි අපගේ ඉදිරි දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ සෞභාග්‍යයට දායක වන විශ්වසනීයවූත්, කාර්යශීලිවූත් ආයතනයක් බවට පත්වීමය. අපගේ මූලික මෙහෙවර වනුයේ ප්‍රතිපත්තිමය උත්තේජනය, උපදෙස්, කැපවීම සහ විශිෂ්ඨත්වය තුළින් තිරසාර වර්ධනයක් ලබාගැනීම සඳහා පිටුවහලක් වීමට ආර්ථික සහ මිල ස්ථායිතාවයත්, මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාවයත් පවත්වා ගෙන යාමයි.

මූල්‍ය අංශයට කෙරෙන උපාය මාර්ගික මගපෙන්වීමට අමතරව සිය අරමුණු ඉටු කිරීමේ දී එය දේශපාලන පක්ෂපාතීත්වයෙන් තොරව තම ස්ථාවරයෙහි ගරුත්වය රැක ගනිමින් හා ඉහළ වෘත්තීයමය නිපුනතාවයකින් යුක්තව විචක්ෂණශිලී ප්‍රතිපත්ති නිර්දේශ රජයට ලබාදීම ද අප විසින් සිදු කරනු ලැබේ. එහිදී අප විසින් කාර්යශීලී මගපෙන්වීමක් වෙනුවෙන් වූ කැපවීම, විනිවිදභාවය, වගකීම, අවංකභාවය, වෘත්තීයමය දක්ෂතාවය වෙනුවෙන් කැපවීම, ඉගෙනීම, දැනුම හුවමාරුව, නවතාවයන් සොයා යෑම, නිරවද්‍යතාවය, කාර්ය නිදහස, ප්‍රතිඵලය වෙනුවෙන් වන නිරන්තර කැපවීම සහ සහායෝගයෙන් කටයුතු කිරීම යන ගුණාංගයන් පවත්වා ගනී.

යොවුන් වෘත්තිකයන් හට

## කළමනාකරණ අභ්‍යාසලාභීන් ලෙස

(මාණ්ඩලික පංතිය 1 ශ්‍රේණියට මාණ්ඩලික නිලධාරීන් ලෙස ඇතුළත් කර ගැනීම සඳහා ඉලක්ක කර ඇති)
ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයට
ඇතුළත් වීමට දැන් අවස්ථාවන් උදා වී ඇත.

**1. ඔබ, පහත සඳහන් සුදුසුකම් සහිත, උද්යෝගීමත්, නායකත්ව ගුණාංගවලින් යුතු, අන් අය සමග සාමුහිකව වැඩ කිරීමේ හැකියාව ඇති, ජයග්‍රහණ අරමුණු කරගත් ශ්‍රී ලාංකිකයෙකු නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයට එක්වීමට ඔබටත් වරම්.**

1.1 **අවශ්‍ය සුදුසුකම් :**

අ. පහත සඳහන් විෂයයන්ගෙන් එකක් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සමාර්ථයක් හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍ය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් සහිත **විශේෂවේදී උපාධියක්**

- ආර්ථික විද්‍යාව
- ගණකාධිකරණය/බැංකුකරණය/මූල්‍යය
- වානිජ්‍ය/කළමනාකරණය
- රාජ්‍ය/ව්‍යාපාර පරිපාලනය
- සංඛ්‍යානය/ගණිතය
- ඉංජිනේරු විද්‍යාව
- පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය

**හෝ**

ආ. ඉහත සඳහන් විෂයන්ගෙන් එකක සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලැබූ විද්‍යාපති හෝ ඊට ඉහළ මට්ටමක **පශ්චාත් උපාධියක්**

**හෝ**

ඇ. පහත දැක්වෙන වෘත්තීය ආයතන මගින් පවත්වන විභාගයන්ගෙන් එකක **පූර්ණ සාමාර්ථය** (Passed Finalist)

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) වරලත් ගණකාධිකරණ පාඨමාලාව
- වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ACCA-UK) වරලත් සහතිකලත් ගණකාධිකරණ පාඨමාලාව
- අමෙරිකා එක්සත් ජනපදයේ CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂක පාඨමාලාව (CFA)
- එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) වරලත් ගණකාධිකරණ පාඨමාලාව
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ පාඨමාලාව (CMA)
- අමෙරිකා එක්සත් ජනපදයේ සහතිකලාභී ප්‍රසිද්ධ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහතිකලත් ප්‍රසිද්ධ ගණකාධිකරණ පාඨමාලාව (CPA-USA)
- ඕස්ට්‍රේලියාවේ, සහතිකලත් වෘත්තියේ යෙදී සිටින ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහතිකලත් වෘත්තියේ යෙදී සිටින ගණකාධිකරණ පාඨමාලාව (CPA-Australia)
- අමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකයන්ගේ ආයතනයේ (IIA - USA) සහතිකලත් අභ්‍යන්තර විගණක පාඨමාලාව (CIA)
- එංගලන්ත සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICA-EW) වරලත් ගණකාධිකරණ පාඨමාලාව

**හෝ**

ඈ. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (AIB-IBSL) හෝ එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (CIB-UK) ආශ්‍රිත සාමාජිකත්වය සමග බලපත්‍රලාභී වාණිජ/විශේෂිත බැංකුවක විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් වසරක පළපුරුද්ද,

**හෝ**

ඉ. නීති උපාධි අවසන් විභාගයේ දී ගෞරව සාමාර්ථයක් සහිත, නොතාරිස්වරයෙකු වශයෙන් කටයුතු කළ හැකි සහ උසාවි/බැංකු සහ මූල්‍ය අංශයේ නීති කටයුතු සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද සහිත නීතිවේදීන්.

1.2 **වයස :** 2012 පෙබරවාරි 17 දිනට අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතු වේ.

1.3 **තෝරා ගැනීමේ පිළිවෙල :** තරඟ විභාගයකින් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ එකකින් හෝ කිහිපයක් මගින්. අයදුම්කරුවන් තරඟ විභාගයේ දී ප්‍රශ්න පත්‍ර තුනකට (සාමාන්‍ය බුද්ධිය, විශ්ලේෂණාත්මක රචනය සහ සාමාන්‍ය දැනීම) පිළිතුරු සැපයිය යුතුය.

**2. ආබාධ සහිත පුද්ගලයන් සඳහා අවස්ථාවන් :**

පහත දැක්වෙන සුදුසුකම් සපුරාලන, ආබාධ සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් ද ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.1 **සුදුසුකම් :** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පිරිනැමූ උපාධියක් හෝ ඊට ඉහළ මට්ටමක සුදුසුකමක්

2.2 **වයස :** 2012 පෙබරවාරි 17 දිනට අවුරුදු 35 හෝ ඊට අඩු විය යුතු වේ.

2.3 **තෝරා ගැනීමේ පිළිවෙල :** සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින්.

2.4 අදාල අයදුම්කරුවන්, නියමිත ආකෘති පත්‍රයෙහි (11.0) වන කොටස පුරවා, ඔහුගේ/ඇයගේ ආබාධ සහිත බව සනාථ කිරීම සඳහා ලියකියවිලි අදාල අයදුම්පත සමග අමුණා එවිය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ ආබාධ සහිත බව තහවුරු කිරීම සඳහා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

**3. වැටුප් හා දීමනා :** වසරක පුහුණු කාලය තුළ සියළු දීමනා ඇතුළත්ව රු. 50,000/- ක ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණු කාලය සාර්ථකව නිම කරන නිලධාරීන් මාණ්ඩලික පංතියේ 1 ශ්‍රේණියේ පරිවාස මාණ්ඩලික නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය කිරීමට සලකා බලනු ලැබේ. අනෙකුත් ප්‍රතිලාභවලට අමතරව මාණ්ඩලික පංතියේ 1 ශ්‍රේණියේ ආරම්භක දළ වැටුප රු. 90,000/- ක් පමණ වේ.

## අයදුම්පත්

ඔබට ඉහත දැක්වෙන තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත්නම් ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කර **2012 මාර්තු 15 වැනි දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර එහිදී අයදුම්කරුවන් නියමිත ආකෘති පත්‍රය පමණක් භාවිතා කළ යුතුය.

**2012.01.29 හා 2012.02.01 දිනයන්හි පළ කරන ලද පුවත්පත් දැන්වීමට අනුව දැනටමත් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.**

සිය ලිපිනය ලියූ, මුද්දර අලවන ලද 9''x4'' ප්‍රමාණයේ ලියුම් කවරයක්, අධ්‍යක්ෂ, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නොː 30, ජනාධිපති මාවත, කොළඹ 01 වෙත එවීමෙන් ආකෘතිපත්‍ර තැපෑලෙන් ගෙන්වා ගත හැක.

එසේම පහත සඳහන් ස්ථානයන්ගෙන් ද ආකෘති පත්‍ර ලබා ගැනීමට පුළුවන

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව<br>දකුණු පළාත් කාර්යාලය<br>35, අනගාරික ධර්මපාල මාවත<br>මාතර | ශ්‍රී ලංකා මහ බැංකුව<br>උතුරු මැද පළාත් කාර්යාලය<br>341, පළමු පියවර, නව නගරය<br>අනුරාධපුරය | ශ්‍රී ලංකා මහ බැංකුව<br>උතුරු පළාත් කාර්යාලය<br>105, අරසාදි පාර<br>යාපනය |
| ශ්‍රී ලංකා මහ බැංකුව<br>මධ්‍යම පළාත් කාර්යාලය<br>805, ත්‍රිකුණාමල වීදිය<br>මන්දන්ඩාවල<br>මාතලේ | ශ්‍රී ලංකා මහ බැංකුව<br>නැගෙනහිර පළාත් කාර්යාලය<br>103, තැපැල් කාර්යාල පාර<br>ත්‍රිකුණාමලය | ශ්‍රී ලංකා මහ බැංකුව<br>බැංකු විදු පියෙස<br>58, ශ්‍රී ජයවර්ධනපුර මාවත<br>රාජගිරිය |

http://www.cbsl.gov.lk මහ බැංකු වෙබ් අඩවියෙන් ද ආකෘති පත්‍ර උපුටා ගත හැකිය.

කරුණාකර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

ඉහත (2) යටතේ අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්, ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ ''කළමනාකරණ පුහුණුවන්නන් - 2'' ලෙස සඳහන් කළ යුතුය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ නියමිත ආකෘති පත්‍රයට අනුකූල නොවන හෝ නියමිත දිනයෙන් පසු ලැබෙන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තවද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අය මේ තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීමට තැත් කිරීම තෝරා ගැනීම සඳහා නුසුදුසුකමක් වනු ඇත.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ සහ බඳවා ගැනීම කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

**අධ්‍යක්ෂ - මානව සම්පත් දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : 2477330, 2477231